# අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# සබරගමුව පළාත

## නිවිතිගල සහ ඇඹිලිපිටිය කලාපවල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති දැනට පුරප්පාඩු වී පවතින නිවිතිගල හා ඇඹිලිපිටිය කලාපවල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

- අයදුම්කරුවන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විය යුතුය. (I ශ්‍රේණියේ අයදුම්කරුවන් නොමැති වුවහොත් පමණක් II ශ්‍රේණිය ද සලකා බලන බැවින්, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධරීන්ට ද මේ සඳහා අයදුම් කළ හැකිය).

**බඳවා ගන්නා ක්‍රමය :**

- විධිමත් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ලකුණු ලබාදීම මගින් (ලකුණු ලබාදීමේ ආකෘතිය www.moe.sg.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකිය)
- අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ජීව දත්ත තොරතුරු සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව **2020 ඔක්තෝබර්** 12 දිනට පෙර **"ලේකම්, අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව, නව නගරය, රත්නපුර"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"නිවිතිගල / ඇඹිලිපිටිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර"** යනුවෙන් සඳහන් කළ යුතුය.
- අයදුම් කරනු ලබන යම් අයදුම්කරුවෙකු ඉහත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ පුරප්පාඩු 02 සඳහාම අයදුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම්, කලාප දෙක සඳහා වෙන වෙනම අයදුම්පත් දෙකක් ඉදිරිපත් කළ යුතු වේ.

**ඒ.ඩබ්. රුක්මණී ආරියරත්න,**
**ලේකම්,**
**අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා**
**සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,**
**සබරගමුව පළාත් සභාව,**
**නව නගරය, රත්නපුර.**

**2020.09.14**